# සමකාලීන විශ්ලේෂී දර්ශනයේ ආරම්භයට බලපෑ දාර්ශනික පසුබිම පිළිබඳ විමසුමක්

**ජගත් බන්දුල සිරිවර්ධන**

බටහිර දර්ශන ක්ෂේත්‍රය වෙතට අවධානය යොමු කිරීමේ දී ග්‍රීක යුගයේ තේල්ස් නම් දාර්ශනිකයාගෙන් ආරම්භ වූ දාර්ශනික චින්තන ධාරාව සුවිශේෂතා රාශියක් ඔස්සේ වර්තමානය දක්වා පැමිණ තිබේ. විවිධ කාලවකවානුවල පැවති සමාජ සන්ධර්භයට හා විශේෂතාවලට අනුකූල වෙමින් දාර්ශනික පද්ධතිය හැඩගැසී තිබේ. ග්‍රීක මධ්‍යතන, නූතන වශයෙන් විකාශනය වූ බටහිර දර්ශනයේ සිව්වන අදියර සමකාලීන දාර්ශනික චින්තන ධාරාවයි. සමකාලීන විශ්ලේෂී දර්ශනය පෙර පැවති දාර්ශනික යුගයන්ගෙන් වෙනස්වන අතර දර්ශන ඉතිහාසය තුළ සුවිශේෂ දාර්ශනික ක්‍රියාදාමයකට අවශ්‍ය පසුතලයක් නිර්මාණය කොට තිබේ. සමකාලීන විශ්ලේෂී දර්ශනයේ ආරම්භය සහ විකාශය, දාර්ශනික පසුබිම පිළිබඳව විමසා බැලීමේදී නොයෙකුත් සාධක රාශියක් ඒ වටා කේන්ද්‍රගත වී තිබේ. මෙකී ලක්ෂණ පිළිබඳව සොයා බැලීමේදී ඊට ප්‍රථමයෙන් සමකාලීන විශ්ලේෂී දර්ශනය(Analitic philosophy) යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පිළිබඳව දළ අදහසක් ලබා ගැනීම වැදගත්ය.

නූතන බටහිර දර්ශනයේ රෙනේ ඩේකාට්ගෙන්(ක්‍රි:ව1596–1650) ආරම්භවන දාර්ශනික චින්තන රටාව ජෝජ් හෙගල් නම් දාර්ශනිකයාගෙන් නිමාවට පත්වේ. එනම් දාහත් වන සියවසේ සිට විසිවන සියවස දක්වා වසර 300 පමණ කාල පරාසයයි. විසිවන සියවස ආරම්භයත් සමග දර්ශන විෂයේ පැවති සන්ධර්භයන්(context) වෙනසකට ලක්වෙමින් නව දාර්ශනික පැතිකඩක් හඳුන්වාදීමට බට්‍රන්ඩ් රසල් නම් දාර්ශනිකයා උත්සහා ගනු ලබයි.[1] පැවතියා වූ දර්ශනික පසුබිම වෙනසකට ලක්කරමින් බට්‍රන්ඩ් රසල් සහ ජී.ඊ. මුවර් නැමති දාර්ශනිකයන් දෙපළ දර්ශන ක්ෂේත්‍රයට නව රීතියක්(method) එකතු කිරීමට සමත් වෙයි.

''ස්වභාවික භාෂාව වෙනුවට න-ස්භාවික භාෂාවක අවශ්‍යතාවය සටහන් කොට, ඒ ගොඩනැගෙන ආකරය නම්, ''දර්ශන විෂයයේ ස්වරූපයට වේ.''[2]

මෙතෙක් දර්ශන ඉතිහාසය තුළ පැවති භාෂාව වූ කලී ස්වභාවික භාෂාවයි(natural language). අප ව්‍යවහාර කරන භාෂාව උපයෝගී කොටගෙන දාර්ශනික සංකල්ප,ඥානයන් විවිධ වූ සන්ධර්භ නිර්මාණය කොට තිබේ. නමුත් මෙලෙස ව්‍යවහාර භාෂාව උපයෝගී කොටගෙන බිහිවන දාර්ශනික සංකල්ප නිසා විවිධ වූ දාර්ශනික ගැටලු බිහිවී තිබේ. මෙම නිසා ව්‍යවහාර භාෂාව පාරිභාෂික වූ භාෂාවක්(technical language) බවට පත්කළ යුතු බව රසල්ගේ නව දාර්ශනික

---

[1]. "දාර්ශනියින් කීප දෙනෙකුට සහ විශ්වවිද්‍යාලවල ආචාර්ය,මහාචාර්යවරුන් කීපදෙනෙකුට පමණක් දර්ශන විෂයය දැඩි ලෙස සීමා විය. විවිධ දාර්ශනික පද්ධතීන් ඇතුළත පැවැති රීතීන් හා ශිල්පීය ක්‍රමවල පිළිගැනීම පිළබඳව එකඟතාවයක්ද නොමැති විය. කැළඹෙන,පැද්දෙන හැඩගැස්මක මේ කාලයේදී, දර්ශන විෂය පැවතිණි.........."ඒ.ඩී.පී කලංසූරිය,බටහිර විශ්ලේෂී දර්ශනය,2008,පිටුව 13.

[2] . එම

සංකල්පය බවට පත්විය. මෙම නිසා මෙතෙක් පැවති ''යථාර්තය ගවේෂණය කළ දර්ශන විෂය, භාෂා ගවේෂණයට යොමු කිරීම බට්‍රන්ඩ් රසල් විසින් සිදුකරනු ලබයි. ව්‍යවහාර භාෂාවෙන් ගොඩනැගුණු සංකල්ප බැහැර කරමින් විශ්ලේෂී කාර්යය මත පදනම් වන න-ස්වභාවික භාෂාවක(non-natural language) ස්වරූපය ගෙන එනු ලැබීය.

''ඥානය යන්න මිනිස් ප්‍රත්‍යක්ෂමය තලය සහ මිනිස් සංවේදනාත්මක තලය සමඟ තාර්කිකව සම්බන්ද වේ. ''ප්‍රත්‍යක්ෂමය තලය යන්න ශ්‍රැතමය ඥානය කේන්ද්‍රිය කොට විග්‍රහ වන අතර සංවේදනාත්මක තලය කේන්ද්‍රීය ලෙස විග්‍රහ වනුයේ ප්‍රතීතිඥානය ඔසේසේ ය ....''[3]

නව දෙයක් සොයා යෑමක් නොව සැඟවී ඇති සත්‍යය, ඥානයක් ගවේෂණය කිරීම සඳහා විශ්ලේෂණ කාර්යය යොදා ගැනීම සඳහා අවකාශ සලසාදීම රසල් විසින් සිදුකරනු ලැබීය. මෙම විශ්ලේෂණ ක්‍රියාදාමය තාර්කික අණුවාදය(Logical atomism) ලෙසින් රසල් ගෙන හැර දක්වමින් වාස්තවිකරණ ක්‍රියාවලියක් බවට දර්ශන ක්ෂේත්‍රය පත්කිරීමට උත්සාහ ගත්තේය. පැවති ස්වභාවික භාෂාව බැහැර කොට නව පාරිභාෂික වූ භාෂාවක් මේ සඳහා හඳුන්වාදීම බට්‍රන්ඩ් රසල් විසින් සිදුකරනු ලබයි. මෙම තාර්කික අණුවාදය ගොඩනැගීම විශ්ලේෂී දර්ශනයේ ආරම්භය වන අතර මේ මත පිහිටා විශ්ලේෂී දර්ශනයේ ක්‍රමික විකාශය සිදුවනු ලබයි.

බට්‍රන්ඩ් රසල්ගේ තාර්කික අණුවාදය(Logical atomism) ගුරුකොටගන්නා ඔහුගේ ශිෂ්‍ය ලුඩ්විග් විට්ගන්ස්ටෛන් විසින් රසල් ඇරඹූ විශ්ලේෂී දර්ශනය ඉදිරියට රැගෙනයාම සිදුකරනු ලබයි. රසල්ගෙන් වෙනස්වන විට්ගන්ස්ටෛන් විශ්ලේෂී දර්ශනයේ නව කේන්ද්‍රීය සළකුණක් තබන අයුරු දැකගත හැකිය.

"න-ස්භාවික භාෂාවක හැඩගැස්ම නම් දර්ශන විෂයේම හැඩගැස්ම වේ"[4]

රසල්ගේ මෙම මූලික මතය පිළිගන්නා විට්ගන්ස්ටෛන් ට්‍රැක්ටේටස් ලොජිකෝ ෆිලෝසොෆිකස් නම් කෘතිය තුළින් නව දාර්ශනික රීතියක් ගෙනහැර දැක්වීමට උත්සාහ කරයි.

දාර්ශනික භාෂාව තුළ ඉදිරිපත් වන විවිධ කියමන්, ප්‍රකාශන, සංකල්ප අර්ථවත් වේද?(meaningfulness) අර්ථවත් නොවේද? (meaninglessness) යන්න සොයා බැලීමේ කාර්යය සඳහා නව දාර්ශනික මිනුම් දණ්ඩක් ගෙනඒමට මොහු උත්සාහ කර තිබේ. දාර්ශනික භාෂාව තුළ ඉදිරිපත් වන සියලුම සංකල්ප කිසියම් වූ දාර්ශනික සංකල්පනාවක් මත ඉදිරිපත් වූයේ නම් ඒවා අර්ථවත් බවින් පෝෂිත බව දක්වමින් මේ සඳහා සත්‍යොක්ෂ්‍ය සන්ධාරයකින්(Verifiable-content) යුත් රීතියක් හඳුන්වා දීමට කටයුතු කරනු ලැබීය.

''සිද්ධිවාචක කියමනක අර්ථය වනාහී එය සත්‍යොක්ෂණය කරන රීතිය නම් වේ''[5]

---

[3] . කුලසේන විදානගමගේ, සමකාලීන භාෂාමය දර්ශනය:ලුඩ්විග් විට්ගන්ස්ටෛන්,1993
තාර්කික අණුවාදයේ කේන්ද්‍රීය සංකල්ප වන්නේ ඉන්ද්‍රීය දත්ත කියමන් සහ ප්‍රත්‍යක්ෂමය කියමන්ය.ප්‍රත්‍යක්ෂ කරන්නාගේ ස්නායු තන්ත්‍රය හා සම්බන්ධවන්නා වූ වස්තු ඉන්ද්‍රීය දත්ත වේ.සංවේදනයේ දී ලබාදෙන ඉන්ද්‍රීය දත්තයන් ප්‍රත්‍යක්ෂය ඔස්සේ හඳුනාගෙන විස්තර කෙරෙන ප්‍රකාශයන් ප්‍රත්‍යක්ෂමය කියමන් වේ.

[4] . ඒ.ඩී.පී කලංසූරිය,බටහිර විශ්ලේෂී දර්ශනය,2008,පිටුව 17.

[5] . ඒ.ඩී.පී කලංසූරිය, බටහිර විශ්ලේෂී දර්ශනය, 2008, පිටුව 61.

අර්ථය පිළිබඳ සත්‍යාපනීය රීතියක් හඳුන්වාදීම තුළින් විට්ගන්ස්ටෛන් දාර්ශනික භාෂාවේ න-ස්වභාවික භාෂාව, විශ්ලේෂී කාර්යයක් වෙත යොමුකරනු ලැබීය. මෙම දාර්ශනික රීතියට අනුව දාර්ශනික පද්ධතියේ ඉදිරිපත් වන සංකල්පනාවන් අර්ථවත්ද, අර්ථශූන්‍ය කියමන් ද යනුවෙන් ගවේශණය කළ හැකි බව විට්ගන්ස්ටෛන්ගේ අදහස විය. මෙම සත්‍යාපණ රීතියේ බිහිවීමත් සමඟම දර්ශනය විශ්ලේෂී වූ භාෂා කේන්ද්‍රියත්වයක් බවට පරිවර්තනය වීමේ ක්‍රියාදාමය සිදුවන ආකාරයත් දක්නට ලැබේ.[6]

පළමු දාර්ශනික ගුරුකුලයේ ආභාසය සමඟ විට්ගනස්ටෛන් පදනම සකස් කරන විශ්ලේෂී දර්ශනයේ උච්චතම අවස්ථාව නිර්මාණය කිරීමට සුවිශේෂී දාර්ශනික ගුරුකුලයක් කටයුතු කරනු ලබයි. සමකාලීන විශ්ලේෂි දර්ශනයේ ව්‍යාප්තිය තවදුරටත් සනිටුහන් කරන අතර විශ්ලේෂී දර්ශනය නව මානයක් වෙතට යොමු කිරීමට ද මොවුන් කටයුතු කරනු ලබයි. වියනා කවය(The Vienna circle) නැමති විද්වත් සංසදය තුළින් ආරම්භය සනිටුහන් කරනු ලබන්නේ තාර්කාණුසාරී යථාභූතවාදීන්ය(Logical Positivism).

ඇත විට්ගන්ස්ටෛන් ඉදිරිපත් කළ සත්‍යක්ෂය සන්ධාරය නැතහොත් අර්ථය පිළිබඳ මිනුම යොදාගෙන දර්ශන විෂය ඇතුලු ශාස්ත්‍රීය විෂය පද්ධතිය කිසියම් වූ වාස්තවික(Objectivity) ක්‍රියාවලියකටත් විද්‍යාවේදී බවට පත්කිරීමේ ක්‍රියාවලියකටත් යොමුකිරීම සඳහා මොවුන් උත්සාහ ගනු ලබයි. දර්ශන ක්ෂේත්‍රයේ පැවතියා වූ අධිභෞතිකවාද ප්‍රමුඛ(metaphysics), සංකල්පනාවන් ප්‍රතික්ෂේප කොට ආනුභාවික වූ ක්‍රියාවලියකට දර්ශන ක්ෂේත්‍රය හැඩගැස්වීමට උත්සාහ කරනු ලබයි. මේ සඳහා ට්‍රැක්ටේටස් ලොජිකෝ ෆිලෝසොෆිකස් කෘතිය තුළින් හඳුන්වා දුන් අර්ථය පිළිබඳ සත්‍යාපණීය මිනුම නව ශිල්පීය ක්‍රමයක් ලෙස තාර්කික යථානුභූතවාදීන් යොදාගනු ලැබීය.

''සිද්ධිවාචක කියමනක අර්ථය වනාහී එය සත්‍යාපණය කරන රීතියයි'' භාෂාවේ ගොඩනැගී ඇති කියමන් ආනුභවික(empirical) සහ සංස්ලේෂී කියමන් මෙම දාර්ශනික රීතිය යටතේ අර්ථවත් වන අතර සෙසු සියලු සංකල්පනාවන් අර්ථශූන්‍ය (විශ්ලේෂී කියමන් හැර) ලෙස සළකා බැහැර කරනු ලබයි. මෙමගින් ආනුභවික හා සත්‍යාපණීය බව නොගන්නා ආගමික සංකල්ප(Religious statsments)" ආචාරවාදී සංකල්ප(ethical concepts)" අධිභෞතික ප්‍රකාශන, ජ්‍යොතිෂය, සෞන්දර්ය සංකල්ප(Aesthetics) යනාදී බොහෝ දෑ අර්ථවත් නොවන සේ සළකා බැහැර කිරීම තර්කාණුසාරී යථානුභූතවාදීන් විසින් සිදු කරනු ලැබීය. තර්කාණුසාරී යථාණුභූතවාදය විට්ගන්සටෛන් දක්වා ලූ සත්‍යාපණ මිනුම මත පිහිටා විශ්ලේෂී දර්ශනයේ හැඩගැස්ම අර්ථවත් කියමන් පැවතෙන විෂයන් තහවුරු කරමින් ඒවා ආරක්ෂා කිරීම සහ ඒවාට වටිනාකමක් එක් කිරීමත්, අර්ථවත් කියමන් විද්‍යාවේදි කිරීමත් සිදුකල අතර සෙසු සංකල්පනාවන් ප්‍රතික්ෂේප කොට දැමීමත් සිදුකරනු ලැබීය.”

[6] .දාර්ශනික ගැටලු මතුවන්නේ ස්වභාවික භාෂාවේ ඌනතා නිසා බවත් න-ස්වභාවික භාෂාවක් ඔස්සේ එම ගැටලු සාර්ථකව විසඳියහැකි බව ඇත විට්ගන්ස්ටෛන්ගේ අදහස විය. තමා පෙර සිටි මත වෙනස් කරන විට්ගන්ස්ටෛන් මෙම මතවාදය ද වෙනස් කර තිබේ. කලින් න-ස්වභාවික භාෂාවක් අවශ්‍යයැයි කියූ විට්ගන්ස්ටෛන් පසුව න-ස්වභාවික භාෂාවක් අවශ්‍ය නොවන බව පවසයි. මෑත විට්ගන්ටෛන්ට අනුව දර්ශන විෂය හැසිරවීම සඳහා ස්වභාවික භාෂාව යෝග්‍ය වේ. මේ සමඟ විට්ගන්ස්ටෛන් භාෂා කේන්ද්‍රීයත්වයක් වෙතට යොමු වේ.

සමකාලීන විශ්ලේෂී දර්ශන විකාශනයත් සමඟ මෙම මතවාදවලට නව ප්‍රතිවිරුද්ධ අදහසක් එක්කිරීමට මෑත විට්ගන්ස්ටෛන් ප්‍රමුඛ දාර්ශනිකයින් පිරිසක් කටයුතු කරනු ලබයි. ඒ අතර ගිල්බට් රයිල්, ජේ.එල්. ඔස්ටින්, පී.එන්. ස්ට්‍රෝසන්, නෝමන් මැල්කම්, රෂ්රිෂ් යනාදී දාර්ශනිකයින් සුවිශේෂ වේ. මුල්කාලීන විශ්ලේෂී දාර්ශනිකයින් සිදුකළ ස්වභාවික භාෂාව හෙවත් ව්‍යවහාර භාෂාව ප්‍රතික්ෂේප කිරීම සහ භාෂාවේ අර්ථවත්භාවය සහ අර්ථශූන්‍යභාවය තීරණය කරනු ලබන සත්‍යාපන්‍ය සන්ධාරය තුළ පවතින දුර්වලතා නිවැරදි කොට ඒ වෙනුවට නව මිනුම් දණ්ඩක් හඳුන්වාදීම සිදුකරනු ලබයි. මෙය මෑත විට්ගන්ස්ටෛන් තමන්ගේ “Philosophical Investigations” යන කෘතියෙන් හඳුන්වාදෙනු ලැබීය. එනම් ස්වභාවික භාෂාව නැවත ඔප් නංවමින් සහ නස්වභාවික භාෂාව හළා දැමීමෙන් සිදුකරනු ලබන්නා වූ ක්‍රියාවලියයි. මෙය මෑත විට්ගන්ස්ටයින්ගේ අර්ථය පිළිබඳ භාවිත මිනුම ලෙස හඳුනාගනු ලැබීය.

“අනිසි ලෙස භාෂාවේ වචන පාවිච්චියේ දි සිදුවන බුද්ධි වශීකරනය නිසා දාර්ශනික ගැටලු බිහිවී දාර්ශනිකයා නොසන්සුන්කමට පත්වීමය. එහි ඵලය වනුයේ අනිසි පාවිච්චියේ ස්වරූපය නොදැන එසේ වචන හරඹයක යෙදීමය. එය නම් අර්ථශූන්‍ය වචන හරඹයක් බව මෑත විට්ගන්ස්ටෛන් දක්වා තිබේ”[7]

විශ්ලේෂී දාර්ශනිකයික් විසින් සිදුකරනු ලබන ක්‍රියාවලිය නිවැරදි නොවන බව දක්වාලමින් භාෂාවේ භාවිතාවය පිළිබඳ මෑත විට්ගන්ස්ටෛන් විස්තර කරනු ලැබීය. මේ වෙනුවෙන් භාෂාවේ භාවිතය පිළිබඳව නව දාර්ශනික ශිල්පීය ක්‍රම කිහිපයක්ද මෑත විට්ගන්ස්ටෛන් විසින් හඳුන්වා දෙනු ලබයි. විශ්ලේෂී ක්‍රියාදාමය නිවැරදි භාෂා භාවිතයක් දක්වා නිවැරදි කිරීම මෑත විට්ගන්ස්ටෛන් විසින් සිදුකරනු ලැබීය.

සමකාලීන විශ්ලේෂී දර්ශනයේ ආරම්භය තාර්කික අණුවාදයක් (Logical atomism) තුළින් ගොඩනැගෙන අතර එය භාෂා භාවිතයකින් නිමාවීම සිදුවනු ලබයි. මෙම සම්පූර්ණ ක්‍රියාවලිය පොදුවේ අප සමකාලීන විශ්ලේෂී දර්ශනය වශයෙන් හඳුනාගනු ලබයි. සරළව දක්වන්නේ නම් බට්‍රන්ඩ් රසල්ගේ තාර්කික අණුවාදය, ඈත විට්ගන්ස්ටෛන්ගේ භාෂා භාවිතය(the use the theory) යන පද්ධති සියල්ලෙහි ඒකරාශිත්වය පොදුවේ විශ්ලේෂී දර්ශනය වශයෙන් හඳුනාගනු ලබයි.

මෙලෙස ක්‍රමිකව විකාශනය වූ බටහිර සමකාලීන විශ්ලේෂී දර්ශනය දාර්ශනික ඉතිහාසය තුළ ක්ෂණිකව පැනනැගුණු දාර්ශනික පද්ධතියක් නොවේ. මෙය ක්‍රමික විකාශනයක සහ මේ සඳහා බලපෑම් කළ දාර්ශනිකයින්, දාර්ශනික මතවාද රාශියක කේන්ද්‍රීය ප්‍රතිඵලය වේ. මෙම නිසා විශ්ලේෂී දර්ශනය බිහිවීම සඳහා පදනම් වූ සහ හේතු වූ දාර්ශනික පසුබිමක් තිබේ. ඒ පිළිබඳව අවධානය යොමු කිරීම තුළ විශ්ලේෂී දර්ශනයේ ආරම්භයේ හේතු සාධක සහ එහි මූලබීජයන්(First cause) පිළිබඳව අවබෝධයක් ලබාගත හැකිය.

බටහිර දර්ශන ඉතිහාසය වෙතට අවධානය යොමුකර බැලීමේ දී විශ්ලේෂී දර්ශනයේ මුල් අංකුරයන් ග්‍රීක යුගයේ සිටම දක්නට ලැබේ. නමුත් එය විශ්ලේෂි දර්ශනයක් හෝ භාෂාමය දර්ශනයක් වශයෙන් නොව එකළ පැවති දාර්ශනික මතවාදයන්, පදනම්වාදයන්ගේ අරමුණු නිවරදි

[7] .G.E.M. Anscombe, An Introduction to Wittgenstein’s Tractatus. 1959.

ලෙස සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් යෙදවීමකි. සම්භාව්‍ය ග්‍රීක දර්ශනය තුළ හමුවන ග්‍රීක දාර්ශනික සොක්‍රටීස් සංකල්ප(concepts) විශ්ලේෂණයක නිරත වෙනු ලබයි. එසේම මොහුගේ සංකල්ප විශ්ලේෂණය යුක්තිය නැමති කේන්ද්‍රීය සංකල්ප මත පදනම් කරයි. යුක්තිය නැමති සංකල්පය විශ්ලේෂණය කරන මොහු මෙලොව විවිධ වූ යුක්තීන් ඇති බවත් ඒවා සියල්ල අනිත්‍ය වූ නිස්සාර යුක්තීන් ලෙසත් දක්වයි. භාෂාවේ උපයෝගීතාවය යොදාගෙන සංකල්ප විශ්ලේෂණයක සොක්‍රටීස් නිරත වූ බව පසුකාලීන නූතන දාර්ශනිකයින්ගේ අදහස වේ. මෙම අභාසය සමකාලීන විශ්ලේෂී දර්ශනයේ විට්ගන්ස්ටෛන්ට ආභාස නොවුන ද භාෂාත්මක භාවිතය(Language approach) අංශයෙන් ගත්කළ භාෂා භාවිතාවයට ද ග්‍රීක යුගය තුළ වැදගත්කමක් හිමිකර දී තිබූ බව පැහැදිලි වේ.[8]

සොක්‍රටීස් විසින් බිහිකරනු ලැබූ සංකල්පවාදය ප්ලේටෝ විසින් තවදුරටත් පෝෂණය කරනු ලබයි. ප්ලේටෝගේ ආකෘතිවාදය ගොඩනැගෙන්නේ මෙම දාර්ශනික විශ්ලේෂණයේ ප්‍රතිඵලයක් ලෙසිනි. සොක්‍රටීස් විසින් ඇතිකරනු ලබන භාෂාත්මක අදහස ප්ලේටෝ ඉදිරියට ගෙන ගොස් තිබේ. ප්ලේටෝගෙන් පසුව හමුවන සම්භාව්‍ය දාර්ශනික ඇරිස්ටෝටල් විසින් ප්ලේටෝගේ ආකෘතිවාදය(theory of forms) ප්‍රතික්ෂේප කරනු ලබයි. නමුත් මේ පිළිබඳව බට්‍රන්ඩ් රසල්ගේ විග්‍රහය වන්නේ ඇරිස්ටෝටල් සිදුකරනු ලබන්නේ ප්ලේටෝගේ ආකෘතිවාදය ප්‍රතික්ෂේප කිරීමට වඩා එය ක්‍රමානුකූලව සකස් කිරීමකි. ප්ලේටෝගේ පාරභෞතිකවාදය, ව්‍යවහාර ඥානය හා සංකලනය කිරීමෙන් ඇරිස්ටෝටල්ගේ දර්ශනය ගොඩනගන බව දර්ශන ඉතිහාසය පිළිබඳ විශ්ලේෂණයක යෙදෙන බ'ට්‍රන්ඩ් රසල් වැඩිදුරටත් දක්වා සිටියි.[9]

සමකාලීන විශ්ලේෂී දර්ශනයේ බිහිවීමේ දාර්ශනික පසුබිම පිළිබඳව අවධානය යොමුකිරීමේදී ප්‍රධාන ස්ථානයන් හත් වන ශතවර්ශයෙන් පසු එළඹෙන නූතන බටහිර දර්ශනයට හිමි වී තිබේ. විශ්ලේෂී දර්ශනයේ හැඩගැස්ම සඳහා නූතන බටහිර දර්ශනයේ සිටි දාර්ශනිකයන්ගේ දාර්ශනික සංකල්පවල ආභාසය ලැබී තිබේ. විශ්ලේෂී  දර්ශනයේ පළමු රටා මට්ටම වූ කලී බට්‍රන්ඩ් රසල්ගේ තාර්කික අණුවාදයයි. මෙම මුල් පදනම්වාදය සකස් කිරීම සඳහා රසල් විසින් පූර්ව දාර්ශනිකයන්ගේ ආභාෂය ලබාගෙන තිබේ. නූතන යුගයේ ක්‍රි.ව. 1646 - 1716 කාල පරාසය නියෝජනය කරන දාර්ශනිකයා වන්නේ ලයිබ්නිට්ස්ය. ලයිබ්නිට්ස්ගේ සුවිශේෂ දාර්ශනික සංකල්ප වන්නේ ''තන්මාත්‍රවාදයයි''(monads) නැතහොත් ''පීදේකකවාදයයි'' පීදේකක(monads) යනු සරල වස්තුන්ය. ලෝකයේ ඇති සංකීර්ණ වස්තුන් මෙකී සරල පීදේකක ඇසුරින් ගොඩනැගෙන්නේ යැයි ලබයිබ්නිට්ස් දක්වයි. ලයිබ්නිට්ස් වැඩිදුරටත් විග්‍රහකරන ආකාරයට,[10]

''සංකීර්ණ වස්තුන් සමූහයක් ලොව ඇති නම් ඒවා තන්මාත්‍රයන් නැමති සරළ වස්තුන්ගේ ඒකරාශීත්ව වීමක් පමණි. තවද මේ ඒකරාශිවීමෙන් ගොඩනැගෙන සංකීර්ණ වස්තුන් කොටස්වලින් යුතු වුවද එම කොටස් නැමති තන්මාත්‍රයෝ කොටස්වලින් නොයුතු සරළ වස්තුහුය. යථාභූතය

[8] .අනෝමා දිසානායක, ආගමික විශ්වාස සහ ලුඩ්විග් විට්ගන්ස්ටෛන්, 2001.
[9] .බට්රන්ඩ් රසල්, බටහිර දර්ශන ඉතිහාසය,1970 , පිටු 100 සිට 233.
[10] .ඒ.ඩී.පී.කලංසූරිය, නූතන බටහිර දර්ශනය, 2007,හතරවන පරිච්ඡේදය(63-82)

වන්නේ කොටස්වලින් යුතු සංයෝගයක් නොව එම සංයෝගයන්ගේ කොටස් සෑදී ඇති සංකීර්ණ ස්වභාවයෙන් තොර සරළ වස්තූන් නැමති තන්මාත්‍රයන්ය ....”[11]

ලයිබ්නිට්ස්ගේ මෙම විග්‍රහයෙහි ආභාසය විශ්ලේෂී දාර්ශනික බට්‍රන්ඩ් රසල්ට බලපා තිබෙන බව පෙනී යයි. රසල් තම තාර්කික අණුවාදය තුළ ගොඩනගන ඉන්ද්‍රීය දත්ත කියමන්වලට(sense datum statements) මෙහි ආභාසය ලැබී තිබෙන බව පෙනීයන කරුණකි.

එසේම ලයිබ්නිට්ස්ගේ දර්ශනය තුළ අඩංගු වන අවශ්‍ය ප්‍රස්තුත(necessary proposition) සහ අවිනිශ්චිත ප්‍රස්තුත පිළිබඳ විග්‍රහය විශ්ලේෂී දර්ශනය තුළ ගොඩනැගෙන භාෂාමය දර්ශනයට බෙහෙවින් සමීපය. අවිසංවාදී රීතිය මත ගොඩනැගෙන අවශ්‍ය ප්‍රස්තුත එහි ස්වභාවයෙන්ම සප්‍රමාණ(Valiodity) වේ. ඊට හේතුව ඒවා ප්‍රාගාණුභූත විශ්ලේෂී (A priori analytic) ප්‍රස්තුත වීමයි. මෙවැනි ප්‍රස්තුතවල සප්‍රමාණතාව රඳා පවතින්නේ අවිසංවාදී රීතිය(low of non Contradiction) මතය. එබැවින් මෙවැනි ප්‍රස්තුතවල සප්‍රමාණතාවයට ආණුභූතිමය සාධක ඇසුරින් අභියෝග කළ නොහැකිය. එහෙත් අවිනිශ්චිත ප්‍රස්තුතවල ස්වභාවය මීට වෙනස් ය. එය ගොඩනැගෙන්නේ පර්යාප්ත හේතු නියමය මතය. මෙම ප්‍රස්තුත කිසියම් සත්‍යෙක්ෂණයක් මත ගොඩනැගේ.

ලයිබ්නිට්ස් ප්‍රස්තුත පිළිබඳව ගෙනඑන මෙම විග්‍රහය සමකාලීන විශ්ලේෂී දාර්ශනිකයෙකු වන ඒ.ජේ. එයර් හඳුන්වාදෙන ප්‍රාගානුභූත (A priori) හා පශ්චාත් ආනුභූත ප්‍රස්තුතවලට සමානතාවයක් දක්වයි. ඒයර් විසින් හඳුන්වාදෙන ප්‍රාගානුභූත විශ්ලේෂී (a priori analytic) ප්‍රස්තුත ද බාහිර ලෝකය පිළිබඳ යමක් නොපැවසෙන අතර නියත ස්වභාවයකින් යුතු වේ. එහෙත් පශ්චාත් ආනුභූත සංස්ලේෂී ප්‍රස්තුත බාහිර ලෝකය පිළිබඳ ආනුභවික යමක් පවසයි. එබැවින් ඒවා නියතතාවයෙන් තොර භව්‍යතාවයක් ගෙන එයි. මේ අනුව සමකාලීන භාෂාමය දර්ශනය තුළ ඒ.ජේ. ඒයර් විග්‍රහකරන කරුණු සන්ධර්භයට ලයිබ්නිට්ස්ගේ විග්‍රහයද සමතාවයක් දක්වන නිසා ලයිබ්නිට්ස්ගේ ආභාසය භාෂාමය දර්ශනයට ද හේතු වී තිබෙන බවක් පෙනී යයි. මේ ආකාරයට බුද්ධිවාදී ලයිබ්නිට්ස්ගේ දාර්ශනික පද්ධතියේ ආභාසය බට්‍රන්ට් රසල් විසින් 1900 දී පළ කරන ලද (mind සඟරාවේ) ලයිබ්නිට්ස්ගේ දර්ශනය පිළිබඳ විචාරාත්මක ව්‍යාඛ්‍යානයක් (A Critical Exposition of the Philosophy of Leibniz) යන ලිපිය තුළින් ද දක්වන අදහස් තුළ පෙන්නුම් කරන්නේ රසල්ට ලයිබ්නිට්ස්ගේ ආභාසය පදනම් වී තිබෙන බවයි.[12]

සමකාලීන විශ්ලේෂී දර්ශන සම්ප්‍රදායට බලපෑ දාර්ශනික පසුබිම පිළිබඳව අවධානය යොමුකිරීම තුළ සුවිශේෂ ස්ථානයක් නූතන බටහිර දර්ශන සම්ප්‍රදායේ අනුභූතිවාදය නියෝජනය කරන දාර්ශනිකයින් වෙතට හිමි වේ. බ්‍රිතාන්‍ය අනුභූතිවාදි(empiricism idias) අදහස් ඍජු ලෙස සමකාලීන විශ්ලේෂී දර්ශන සම්ප්‍රදාය කෙරෙහි බලපා තිබේ. අතැමුන් ප්‍රකාශ කරන ආකාරයට බ්‍රිතාන්‍ය අනුභූතිවාදයේ උච්චතම අවස්ථවක් ලෙසත් එහි අග්‍රඵලය ලෙසත් බ්‍රිතාන්‍ය ප්‍රමුඛ ඉංග්‍රීසි භාෂාව කතා කරන ලෝකය තුළ සමකාලීන විශ්ලේෂී දර්ශනය බිහි වූ බවයි. ක්‍රි.ව. 1632-1714 අතර

[11]. ඒ.ඩී.පී කලංසූරිය, බටහිර විශ්ලේෂී දර්ශනය, 2008, පිටුව 74.

[12] . ඒ.ඩී.පී.කලංසූරිය, නූතන බටහිර දර්ශනය, 2007,හතරවන පරිච්ජේදය(63-82)
G.M.Duncon, The Phiosophical works of Leibniz,1960.p 170.

නූතන දර්ශන කාල පරාසය නියෝජනය කරන දාර්ශනිකයා ජෝන් ලොක්ය. ඥානයේ ප්‍රභවය පිළිබඳව කරුණු දක්වන ලොක් එය සම්පූර්ණයෙන්ම සංවේදනය (Sensation) හා ප්‍රත්‍යක්ෂය (perception) යන අනුභූතිමය (Experience) සාධක දෙක ඔස්සේ ගොඩනැගෙන බව දක්වනු ලබයි. සංකල්ප යනු අන් කිසිවක් නොව ලෝකය පිළිබඳව ඇති භාෂාමය නිර්මාණයන්ගේ ප්‍රත්‍යක්ෂමය ඥාණය(perceptual Knowledge), භාෂාවෙන් විග්‍රහ කරන ජෝන් ලොක් කිසියම් සංකල්පයක් සංකීර්ණ බවින් යුක්ත වේ නම් එය සරළ සංකල්ප දක්වා විග්‍රහකල යුතු බව දක්වනු ලබයි. මෙම අදහස නැවත ප්‍රතිනිර්මාණය කරනු ලබන්නේ බට්‍රන්ඩ් රසල් විසිනි.

"…….ද්‍රව්‍ය වස්තුන්ගේ පවතින්නා වූ ගුණයන් වනාහී ප්‍රධාන ගුණයෝ ( Primary qualities) වෙති. ද්‍රව්‍ය වස්තුව කුමන විප්ලවීය වෙනසකට භාජන වුවද එම ද්‍රව්‍ය වස්තුවෙහි ප්‍රධාන ගුණයන් නැසී නොයේ. තවද, ඒවා ද්‍රව්‍ය වස්තුවෙන් වෙන් කිරීමට ද කොහෙත්ම නොහැකිය. ඕනෑම ද්‍රව්‍ය වස්තුවක් ඉතා කුඩා වෙනතුරු බෙදීමේ දී වුව ද මෙම ප්‍රධාන ගුණයෝ නොනැසී පැවැතෙති. තිරිඟු ඇටයක සම්පූර්ණ බෙදීමක් ලොක් ඉදිරිපත් කරයි. තිරිඟු ඇටයක් ඉතා සියුම් හෝ ඉන්ද්‍රියන්ට හසු නොවන සේ හෝ කුඩාවට බෙදුවද එම ද්‍රව්‍ය වස්තුවෙහි ඇති ප්‍රධාන ගුණයෝ වන ඝනත්වය (Solidity) ව්‍යාප්තිය (Extension) ප්‍රකාරය (Figure) සහ චලනය (mobility) ශූන්‍ය තත්ත්වයට පත් නොවෙති……"[13]

මෙකී ආභාසය බට්‍රන්ඩ් රසල්ගේ තාර්කික අණුවාදය තුළ මනාව දැකගත හැකිය. එනම් රසල් පාරිභාෂිත අර්ථයෙන් දක්වන ඉන්ද්‍රිය දත්ත කියමන්(sense datum statements) හෙවත් අණුක කියමන් (atomism) සඳහා මෙම ලොක්ගේ ආභාසය හේතුකොටගෙන තිබේ.

"අධිභෞතික ස්වරූපයක් උසුලන ලද සංකල්පයන් අර්ථ ශූන්‍ය තත්ත්වයක පවතිනු ලබයි"[14]

-ජොන් ලොක්-

මෙම ලොක්ගේ දාර්ශනික අදහස සමකාලීන විශ්ලේෂී දර්ශනය තුළ සුවිශේෂ වටිනාකමක් හිමිකරගන්නා තර්කානුසාරී යථානුභූතවාදීන් කේන්ද්‍රීය කොටගත් අදහසකි.

"…වස්තුව යන්න සරළ සංකල්පයක් නොව සංකීර්ණ සංකල්පයකි. එනම් සංවේදනයන්(seiation) හෝ ප්‍රත්‍යක්ෂයන් (perception) හෝ මාර්ගයෙන් ලබන ලද සරළ සංකල්පයෝ මනසේ ශක්තිය හේතු කොටගෙන සංකීර්ණ සංකල්පයක් බවට පත්වෙති. මින් පෙනෙනුයේ 'වස්තුව' නැමැති භාෂාවේ දැකගත හැකි වචනය සරළ සංකල්පයන්ගේ මානසික ඒකරාශිවීමක් පිළිබඳව තනාගත්තක් බවයි….."[15]

මෙලෙස ඥානය පිළිබඳ විස්තරයක යෙදෙන අනුභූතිවාදී දාර්ශනික ජොන් ලොක්ගේ අදහස් න-ස්වාභාවික භාෂාවක් ගොඩනැගීම සඳහා රසල්ට ඍජු ලෙස බලපා තිබේ. එසේම රසල් විසින් න-

[13] ඒ.ඩී.පී.කලංසූරිය, නූතන බටහිර දර්ශනය, 2007,පිටුව, 103 සහ 104.
[14] .එම. පිටුව 117.
[15] ඒ.ඩී.පී.කලංසූරිය, නූතන බටහිර දර්ශනය, 2007, පස්වන පරිච්ඡේදය (91-135)

ස්වාභාවික භාෂාව සඳහා යොදාගනු ලබන ශිල්පීය ක්‍රමයන් වූ කලී ලොක්ගේ දර්ශනයේ දක්වන සංකල්පවල වැඩි දියුණු වීමක් බවද සඳහන් කළ හැකිය.

අනුභූතිවාදියෙකු වන ජෝර්ජ් බර්ක්ලේ (ක්‍රි.ව. 1685 - 1753) ප්‍රත්‍යක්ෂයන් තොරව කිසිවකට පැවැත්මක් නොමැති බව සඳහන් කොට සිටී.

"මට ප්‍රත්‍යක්ෂ නොවන විට හෝ මාගේ මනසෙහි නොපවතින විට හෝ සදාකාලික දෙවියන්ගේ මනසෙහි නොපවතින විට හෝ යමකට කිසිම පැවැත්මක් නැත"[16]

"පැවැත්ම යනු ප්‍රත්‍යක්ෂයයි". බර්ක්ලේගේ දර්ශනයේ විග්‍රහ වන තර්කවල දෝෂයන් (philosophical error) නිවැරදි කිරීමට සමකාලීන විශ්ලේෂී දාර්ශනික ජී.ඊ. මූවර් උත්සාහ ගෙන තිබේ. ප්‍රත්‍යක්ෂමය ක්‍රියාවක් පවතින්නේ හෝ නොපවතින්නේ හෝ වුවද ප්‍රධාන ගුණයෝ ස්වෛරී ලෙස පවතිති. ප්‍රධාන ගුණයන් වශයෙන් ඝනත්වය, ව්‍යාප්තිය, ප්‍රකාරය සහ චලනය නැමති සංවේද්‍යතා ගුණයන් පිළිගැණුනු අතර වර්ණ, හැඩ, සුවඳ, රස යනාදී අනෙක් සංවේද්‍යතා ගුණයන් ද්විතියික ගුණයන් බවට පත්විය. ප්‍රධාන ගුණයෝ ද්‍රව්‍යය (matter) හෙවත් වස්තුව (substance) නැමති සංවේදනයන්ගෙන් තොර යම් කිසිවකට ඇතුළත් වූහ. "ඉඳින් දැනීම, ඇසීම, බැලීම, චලන, පෙනීම යනාදිය ප්‍රත්‍යක්ෂ කරනුයේ මනුෂ්‍ය ඉන්ද්‍රියයන්ය. මේ ප්‍රත්‍යක්ෂයෝ හෙවත් සංවේදනයෝ මනසෙහි දී සංකල්පයන් බවට පැමිණෙති. අපට ප්‍රත්‍යක්ෂයන් මාර්ගයෙන් කිසියම් බාහිර වස්තුවක සංවේද්‍යතා ගුණයන් ලැබෙන බව සත්‍යයකි. එහෙත් අප මනස දන්නේ ඒ ප්‍රත්‍යක්ෂයන් මනසේ සංකල්පයන් වූ විටය. බර්ක්ලේ බාහිර ලෝකය ප්‍රතික්ෂේප නොකරයි. නමුත් එහි ද්‍රව්‍යමය බව ප්‍රතික්ෂේප කරන්නේ යථාභූතය සංකල්පීය විය යුතුය යන පදනමේ සිටය. ආනුභූතිවාදියෙකු වුවද බර්ක්ලේ සිය දාර්ශනික කාර්යයේ දී භාෂාව භාවිත කර ඇති ආකාරය ගැටලු සහගතය. ඊට හේතුව ලෙස භාෂා දාර්ශනිකයන් භාෂා භාවිතය පිළිබඳව බර්ක්ලේට අවධානයක් නොතිබූ බව සඳහන් කරමින් මෙහි දුර්වලතා නිවැරදි කරමින් එහි ආභාසය තමන්ගේ විශ්ලේෂී දාර්ශනික පද්ධතිය ගොඩනැගීම සඳහා පාදක කොටගෙන තිබෙන ආකාරය දක්නට ලැබේ.

සමකාලීන විශ්ලේෂී දර්ශන සම්ප්‍රදාය බිහිවීම කෙරෙහි බලපෑ දාර්ශනික පසුබිම තුළ හමුවන සුවිශේෂතම දාර්ශනික සංකල්පනා අන්තර්ගත වන්නේ නූතන බටහිර දර්ශන සම්ප්‍රදායේ ඩේවිඩ් හියුම්ගේ දාර්ශනික පද්ධතිය තුළය. විශ්ලේෂී දර්ශන සම්ප්‍රදායේ ආරම්භකයින් වන බට්‍රන්ඩ් රසල් ප්‍රධාන ජී.ඊ. මූවර්ට ද අවශ්‍ය මූලබීජ (First cause) සැපයෙන්නේ ඩේවිඩ් හියුම්ගේ දාර්ශනික අදහස් තුළිනි. එසේම පසුකාලීනව විශ්ලේෂී දර්ශන සම්ප්‍රදායේ කේන්ද්‍රීය සටහන් තබන විට්ගන්සටෛන් ද ඩේවිඩ් හියුම්ගේ දාර්ශනික මූලබීජවලින් පෝෂණය වී තිබෙන බව විට්ගස්ටෛන්ගේ දාර්ශනික අදහස් අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වේ. මෙහිදි සුවිශේෂ අදහසක් ලෙස මෙය සඳහන් කළ හැකිය. "සියලු සංකීර්ණ සංකල්ප සරළ සංකල්ප ඇසුරෙන් ගොඩනැගෙන බව පවසන හියුම් භාෂාවේ පවතින සංකල්ප අතර පවතින ස්වභාවයද විග්‍රකර දැක්වීය. ඩේවිඩ් හියුම් විග්‍රහ කරන සිද්ධිවාචක කරුණු(factual statemen) සහ සංකල්පයන්ගේ සම්බන්ධයන් (Relations of Ideas) යන

[16] .A.C. Fracer Clarender, A Treatise concering the principle of Human knowledge,George Burkeley,1901. Part 1.sect 6.

සංකල්පයන් ප්‍රතිනිර්මාණය වී විශ්ලේෂී දර්ශන සම්ප්‍රදාය තුළ විශ්ලේෂී සහ සංශ්ලේෂී ප්‍රස්තුතවලට පදනම වැටී තිබේ. එසේම හියුම් දක්වන සංකල්පයන්ගේ සම්බන්ධයන් සහ ගණිතමය (රූපික) ආරක් ගන්නා ප්‍රස්තුත සහ බාහිර ලෝකයේ කරුණු සමග විමසා බැලෙන සිද්ධිවාචක කරුණු (fact) මත පිහිටා විට්ගන්ස්ටෛන් තම දාර්ශනික රීතිය (සත්‍යාක්ෂණිය සන්ධාරය)(Factual content) ගොඩනැගීමට උත්සුක වී තිබෙන බවද පෙනී යයි.

ඉන්ද්‍රීය ප්‍රත්‍යක්ෂය හා අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය පිළිබඳ පැහැදිලි අවබෝධයකින් යුතුව සිය දර්ශනය හැසිර වූ හියුම් දාර්ශනික භාෂාවට කිසියම් තාර්කික පදනමක් ලබාදෙමින් සංස්ථිතික(consistency) දර්ශනයක් ගොඩ නැගූ බව පසුකාලීන දාර්ශනිකයන්ගේ අදහස විය. හියුම්ගේ මෙම අදහස් වල වැඩි දියුණු වීම සමකාලීන විශ්ලේෂී දර්ශණය බිහිවීම සඳහා පාදක වූ බව බොහෝ දෙනාගේ පිළිගැනීම විය.

විශ්ලේෂි දර්ශන සම්ප්‍රදායේ බිහිවීම සඳහා ධනාත්මක හේතු සාධක මෙන්ම ඍණාත්මක හේතු සාධක ද බලපා තිබෙන බව විශ්ලේෂි දාර්ශනික පසුබිම ගවේෂණයේදී දක්නට ලැබේ. ජොජ් හෙගල් විසින් ඉදිරිපත් කරන ලද විඥානවාදය පරම විඥානවාදයක් ලෙස එකල හඳුනාගත හැකිය. එය ඉතා දුරාවබෝධ හා සැමවිට භෞතික ලෝකය හා ආනුභූතිය දෙවැනි කොට සලකනු ලැබීය. විඥනවාදය(Idealism) පසක්කොට සලකන ලද්දේ මනස හා බුද්ධියයි. හෙගල්ගේ විඥානවාදය විසිවන සියවසේ මුල් භාගය පමණ වන විට ජර්මනිය පමණක් නොව එංගලන්තය වැනි රට වලද ව්‍යාප්ත වී පැවතුණි. එන්ගලන්ත දාර්ශනිකයෙකු වූ එච්.එම්. බ්‍රැඩ්ලි එංගලන්තය ප්‍රමුඛකොටගෙන විඥානවාදය(Idealism) ව්‍යාප්ත කිරීමෙහි යෙදී සිටියෙකි. එකල බොහෝ බටහිර විශ්වවිද්‍යාලවල පළමු වසර සිසුනට දර්ශන විෂය හැදෑරීම අනිවාර්ය වූ අතර එහිදී දර්ශනය ලෙස උගන්වන ලද්දේ හෙගල්ගේ විඥානවාදී දර්ශනයයි. මෙම පසුබිම තුළ මෙහි ඇති කයෝර බව නිසා ඇති වන අකමැත්ත මත විඥානවාදයට එරෙහිව විරෝධතාවන් එල්ල විය. එසේම මේ වටා විවිධ බුද්ධිමතුන්, උගතුන් ඒකරාශිවීමේ ප්‍රතිඵලය මත මෙම විඥානවාදය දර්ශන ක්ෂෙත්‍රයෙන් බැහැර කිරීමේ ක්‍රියාදාමය උදෙසා භාෂාව නිවැරදිව කිරීමට උත්සහා කිරීමේ ක්‍රියාවලියද යම් අකාරයකින් සමකාලීන විශ්ලේෂි දර්ශනය ගොඩ නැගීමට පසුබිම් වී තිබේ.[17]

අනෙක් අතට සලකා බලන කල කිසිම විෂයකට ස්වාධීනව කටයුතු කිරීමේ හැකියාවක් නොමැත. මේවා සියල්ල එකිනෙකට සම්බන්ධ වෙමින් ශාස්ත්‍රීය පද්ධතිය හැඩ ගන්වනු ලබයි. එම නිසා සමකාලීන විශ්ලේෂණ දර්ශනයේ ආරම්භක පසුබිම සඳහා භෞතික විද්‍යාව ඇතුලු ගණිතමය ක්ෂේත්‍රයේ ආභාසය ද හේතු වී තිබේ. මේ බව විශ්ලේෂි දර්ශන සම්ප්‍රදායේ ආරම්භකයින් ලෙස හඳුනාගන්නා රසල්ගේම ප්‍රකාශයක් තුළින් පැහැදිලි වනු ඇත. '' ශුද්ධ ගණිතයේන් මෙන්ම භෞතික විද්‍යාවෙන් ද තර්කානුකුල විශලේෂණය සම්බන්ධ දර්ශනය සඳහා කරුණු සැකසී ඇත. මෙය විශේෂයෙන්ම සාපේක්ෂතාවාදය සහ ක්වොන්ටම් යාන්ත්‍ර විද්‍යාව මගින් සිදු වී තිබේ.[18]

[17] .J. Hartnack, Wittgnestein and modern philosophy, 1959,p.49

[18] . බට්රන්ඩ් රසල්, බටහිර දර්ශන ඉතිහාසය,1970 , පිටවු 911.

මේ ආකාරයට පුළුල් විෂය කරුණු සහ දාර්ශනික බලපෑම්හි ප්‍රතිඵල වශයෙන් විශ්ලේෂී දර්ශන සම්ප්‍රදායේ බිහිවීමේ පසුබිම නිර්මාණය විය. මෙහිදී සුවිශේෂ වන අනෙක් අංශය වන්නේ මෙම දාර්ශනික ආභාෂයත් සමඟ විශ්ලේෂී දර්ශන සම්ප්‍රදායක් ලෙසින් නව දාර්ශන සාම්ප්‍රදායක් බිහි කිරීම සඳහා ප්‍රධාන දාර්ශනිකයින් දෙපලක් කටයුතු කරනු ලැබීමයි. එනම්, බර්ට්‍රන් රසල් සහ ජී. ඊ. මුවර් යන දෙදෙනායි. මොවුන් මෙහිදී ප්‍රධානත්වයක් ගන්නා අතර ඒ සඳහා මොවුන් එකළ ඉදිරිපත් කල ලිපි ලේඛන සුවිශේෂී වැදගත්කමක් හිමිකර ගත්තේය. 1900 දී පළ කරන ලද ලයිබ්නිට්ස්ගේ දර්ශනය පිළිබඳ විචාරාත්මක ව්‍යාඛ්‍යානයක් (A Critical Exposition of the philosophy of Leibniz), 1903 දී පළ කරන ලද ගණිතයේ මූලධර්ම(principles of mathematics), 1905 දී පළ කරන ලද අර්ථය දැක්වීම(On Denoting) සහ තාර්කික ආකෘතිවාදය(Theory of Logical forms) ලිපි ලේඛන වැදගත් විය. එසේම 1903 දී ජී. ඊ. මුවර් විසින් මයින්ඩ්(Mind) සගරාවේ පල කරන ලද විඥානවාදයේ නිශ්ප්‍රභාව(The Refutation of Ideolism) සහ පැවැත්ම යනු ප්‍රත්‍යක්ෂයයි(Ess est percipi), යන ලිපි ලේඛණ වැදගත් විය.

මේ ආදි වූ ක්‍රියාදාමයක උසස්ම ප්‍රතිඵලය වශයෙන් විශ්ලේෂී දර්ශනය, දර්ශන ඉතිහාසය තුළ සමකාලීන යුගය ලෙසින් සනිටුහන් විය.

**ආන්තික සටහන්**

කලංසූරිය ඒ.ඩී.පී, *නූතන බටහිර දර්ශනය,* අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2007.

කලංසූරිය ඒ.ඩී.පී, *දර්ශනය ප්‍රත්‍යක්ෂය සහ ඥානය*, ආරිය ප්‍රකාශකයෝ, නොඃ34, අගුරුවැල්ල පාර, වරකාපොල , 1988.

කලංසූරිය ඒ.ඩී.පී, *බ්‍රටන්ඩ් රසල් සහ සමකාලීන දර්ශනය*, සමයවර්ධන, කොළඹ, 1975.

කලංසූරිය ඒ.ඩී.පී, *බටහිර විශ්ලේෂී දර්ශනය*, ආරිය ප්‍රකාශකයෝ, බෞද්ධ විද්‍යාලය මාවත, වරකාපොළ, 2008.

දිසානායක අනෝමා, *ආගමික විශ්වාස සහ ලුඩ්විග් විට්ගන්ස්ටෛන්*, සරසවි ඕෆ්සෙට්, මාවනැල්ල, 2001.

විදානගමගේ කුලසේන, *සමකාලීන භාෂාමය දර්ශනයඃ ලුඩ්විග් විට්ගන්ස්ටෛන්*, කුලසේන විදානගමගේ, විහාරේගම, නාරම්මල 1993.

විදානගමගේ කුලසේන, *දාර්ශනික ගැටලුඃපළමුවන කාණ්ඩය*, කුලසේන විදානගමගේ, විහාරේගම, නාරම්මල ,1997.

රසල් බට්රන්ඩ්, *බටහිර දර්ශන ඉතිහාසය*, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,1970.

B.Russell, *The Problems of Philosophy*,Oxford University Press.Reprint,1962.

Bryan Magee, *Modern British Philosophy*,(ed)Secker & Warburg, London,1942.

G.M Duncon,*The Philosophical works of Leibniz*, New Haven,1960.

J. Hartnack, *Wittgenstein and Modern philosophy*,London, 1959.

D.F.Pears, *Bertand Russell and British Tradition in Philosophy*,London,1959.

N.Kemp Smith, *The philosophy of David Hume,* Macmilan and Co.Ltd. London, 1949.